# වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව

## ප්‍රසම්පාදන දැන්වීම

වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව විසින් පලාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘතිය ඉටුකිරීම සඳහා තරඟකාරී ක්‍රමයට ප්‍රජා පාදක සංවිධාන/ කොන්ත්‍රාත්කරුවන් මඟින් මුද්‍රා තබන ලද ලංසුපත් කැඳවනු ලැබේ.

| විස්තරය | අවශ්‍ය ලියාපදිංචිය (CIDA) | ලංසු සුරක්ෂණය රු. | ලංසුපත්‍ර ගාස්තුව රු. |
|---|---|---|---|
| 01. ආදාහනාගාර භූමිය තාර යොදා සංවර්ධනය කිරීම | C 9 හෝ ඉහළ (මාර්ග) | රු. 30,000.00 | රු. 2000.00 |
| ලංසු ඉදිරිපත් කිරීමට පෙර ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන ලෙසට ලංසුකරුවන්ට මෙයින් උපදෙස් දෙනු ලැබේ. | | | |

ඒ සඳහා කැමැත්තක් දක්වන ප්‍රජා පාදක සංවිධාන/ කොන්ත්‍රාත්කරුවන් සඳහා අදාල ලංසුපත් 2025/09/10 දින සිට 2025/09/24 දින දක්වා රජයේ වැඩ කරන දිනයන්හිදී පෙ.ව 9.00 සිට ප.ව 1.00 වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ සරප් වෙත අදාල මුදල් ගෙවා ලබා ගත හැකිය. ලංසු ඉදිරිපත් කිරීම ප්‍රාදේශීය සභාව වෙත මුදල් ගෙවා ලබා ගන්නා ආකෘතිවලින් පමණක් සිදු කළ යුතු අතර ලංසුපත් පරීක්ෂාව කාර්යාල වේලාව තුල නොමිලයේ සිදුකල හැකි ය. වැඩිදුර තොරතුරු සඳහා කාර්යාල වේලාව තුල 091-2260554 දුරකථන අංකය ඇමතිය හැකි ය.

ඉහත අයදුම්පත්‍රය සමඟ ප්‍රජා පාදක සංවිධාන/ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කළ සහතිකයේ සහතික කළ පිටපතක්, ප්‍රජා පාදක සංවිධානයේ/ කොන්ත්‍රාත් සමාගමේ බැංකු ලේඛනයේ 2025.09.10 දිනට හෝ ඊට පසු යාවත්කාලීන කර බැංකුව විසින් සහතික කරන ලද පිටපතක් හා මීට පෙර ඉටුකරන ලද කාර්යයන් පිළිබඳ තොරතුරු (අදාළ කාර්යයන්වල ප්‍රමිතිය සම්බන්ධව සෑහීමකට පත්විය හැකි සාක්ෂි) ඉදිරිපත් කළ යුතු ය.

ලංසුව සමඟ ඉදිරිපත් කරනු ලබන ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවකින් ලබා ගත් සභාපති, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව නමින් 2025/09/24 දින සිට 2025/11/12 දින දක්වා වලංගු ලංසු ඇපකරයක් හෝ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ සරප් වෙත මුදල් ගෙවීමෙන් අනතුරුව ලබාදෙන කුවිතාන්සිය හෝ ලංසු පත්‍රිකාව සමඟ ඉදිරිපත් කළ යුතු ය. චෙක්පත් හෝ බැංකු අණකර ලෙස ඉදිරිපත් කරන ලංසු ඇපකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන ලංසුපත් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර එහි මුල් පිටපතෙහි "මුල් පිටපත" යනුවෙන් සඳහන් කළ යුතු අතර අනු පිටපතෙහි "අනු පිටපත " යනුවෙන් සඳහන් කළ යුතු ය. ලංසුපත්වල මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා එම කවර දෙක එක් කවරයක බහා එම කවරයද මුද්‍රා තබා එහි වම්පස ඉහළ කෙළවරෙහි **"2025.09.24 ප්‍රසම්පාදන කමිටුව සඳහා ලංසුපත්"** ලෙස සඳහන් කර ඉදිරිපත් කළ යුතු ය.

සම්පූර්ණ කරන ලද ලංසු පත්‍රිකා 2025.09.24 වන දින ප.ව 2.00 ට ප්‍රථමයෙන් ලැබෙන සේ "සභාපති, ප්‍රසම්පාදන කමිටුව, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව, අගලිය, බද්දේගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසුපත් හා අඩුපාඩු සහිත ලංසුපත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසුපත් විවෘත කිරීම 2025.09.24 වන දින ප.ව 2.00 ට වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටු සභාපතිගේ ප්‍රධානත්වයෙන් වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේදී සිදු කරන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ලංසුකරුගේ බලයලත් නියෝජිතයින්ට සහභාගී විය හැකි ය.

මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව අවසන් තීරණය වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

සභාපති,<br>
ප්‍රසම්පාදන කමිටුව,<br>
වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව,<br>
අගලිය,බද්දේගම.<br>
2025.09.10